# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1824/29 - 2013 අගෝස්තු මස 23 වැනි සිකුරාදා - 2013.08.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2 වැනි වගන්තිය යටතේ පැවැත්වෙන පරීක්ෂණය

බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලි බල හා බලශක්ති, මිනිස් බල හා රැකීරක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(2) වගන්තියෙහි සඳහන් විධිවිධානවලට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, පහත සඳහන් කරුණු/චෝදනා හේතු කොටගෙන කැළණිය ප්‍රාදේශීය සභාව කටයුතු කිරීමේදී ඉහත කී ප්‍රඥප්තියේ 2(1) වගන්තිය යටතේ දක්වනු ලබන වරදවල් සිදු කර තිබේද යන්න පරීක්ෂා කර බලා වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1795/30 හා 2013 ජනවාරි මස 30 වන දිනැති අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් පත් කරන ලද විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු ඩබ්ලි කරුණාරත්න මැතිතුමාගෙන් සැදුම්ලත් ඒකපුද්ගල පරීක්ෂණ සභාවෙහි පරීක්ෂණ කාලය ජූලි 17 දින සිට ඔක්තෝබර් 17 දින දක්වා මෙයින් දීර්ඝ කරනු ලබන බව නිවේදනය කරමි.

ප්‍රසන්න රණතුංග,<br>
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය,<br>
මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්,<br>
අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලි බල<br>
හා බලශක්ති, මිනිස් බල හා රැකීරක්ෂා සහ<br>
ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය,<br>
බස්නාහිර පළාත.

2013 අගෝස්තු මස 09 වැනි දින,<br>
කොළඹ 07,<br>
ශ්‍රාවස්ති මන්දිරයේ පිහිටි,<br>
බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.

09 - 147


1A - PG 001734 — 175 (2013/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*